# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

## ප්‍රායෝගික / යෝග්‍යතා පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම

## විශ්වවිද්‍යාල ප්‍රවේශය - 2024/2025 අධ්‍යයන වර්ෂය

**(2024 අ.පො.ස. උ/පෙළ ප්‍රතිඵල මත)**

- **දෘශ්‍ය කලාවේදී ගෞරව උපාධි පාඨමාලාව**
- **ප්‍රාසංගික කලාවේදී (සංගීතය / නර්තනය හා නාට්‍ය) ගෞරව උපාධි පාඨමාලා**

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉහත සඳහන් උපාධි පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2024 / 2025 අධ්‍යයන වර්ෂය සඳහා නිකුත් කර ඇති විශ්වවිද්‍යාල ප්‍රවේශ අත්පොතෙහි සඳහන් තොරතුරු වලට අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් 2025.05.16 දින සිට 2025.05.30 දින දක්වා යෝග්‍යතා පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලා හා යෝග්‍යතා පරීක්ෂණ සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**01. ප්‍රවේශය සඳහා අවශ්‍ය අවම සුදුසුකම්**

කිසියම් අපේක්ෂකයෙකු තමන් හැදෑරීමට බලාපොරොත්තු වන අධ්‍යයන පාඨමාලාවට අදාළ විෂය සඳහා (සංගීතය, නර්තනය, නාට්‍ය හා රංග කලාව, චිත්‍ර හා මූර්ති) අ.පො.ස. (උසස් පෙළ) 2024 විභාගයේදී අවම වශයෙන් සම්මාන (C) සාමාර්ථයක් ද, අතිකුත් ඕනෑම විෂයයන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථය ලබා තිබිය යුතුය. මෙම අවශ්‍යතාවය අනිවාර්ය වේ.

**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝග්‍යතා පරීක්ෂණයට අයදුම් කරන සියලුම සිසුන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙතද අයදුම් කළ යුතුය.**

අ.පො.ස. උ.පෙ. 2024 විභාග ප්‍රතිඵල නැවත සමීක්ෂණය සඳහා යොමු කර ඇති අයදුම්කරුවන් සහ ප්‍රතිඵල තාවකාලිකව අත්හිටුවා ඇති අයදුම්කරුවන් හටද මේ සඳහා අයදුම් කළ හැකිය.

**02. අයදුම් කළ යුතු ආකාරය**

අයදුම්කරුවන් විශ්වවිද්‍යාලයීය නිල වෙබ් අඩවිය වන www.vpa.ac.lk වෙත පිවිස "Aptitude Test-2024/2025" ඔස්සේ මාර්ගගත ක්‍රමයට (Online) අයදුම්පත සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය.

**03. ගෙවීම් කළ යුතු ආකාරය**

යෝග්‍යතා පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන්ගෙන් එක් පාඨමාලාවක් සඳහා රු. 2,000.00 ක ගාස්තුවක් අය කරනු ලැබේ. එම මුදල සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය නමින් ලංකා බැංකුවේ නිදහස් චතුරස්‍ර ශාඛාවේ අංක 84072227 දරන ගිණුමට බැරවන පරිදි ඕනෑම ලංකා බැංකු ශාඛාවකට සිදු කළ හැකිය. ගෙවීම් සිදු කිරීමේදී, තැන්පතුපතෙහි **අයදුම්කරුගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කිරීම අනිවාර්ය වේ. මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) මගින් සිදු කරන ගෙවීම් වලංගු නොවේ.**

පාඨමාලා කිහිපයක් සඳහා යෝග්‍යතා පරීක්ෂණ වලට පෙනී සිටීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් එම පරීක්ෂණ සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ගෙවීම් ද වෙන වෙනම සිදු කළ යුතුය.

04. අයදුම්කරුවන් පහත සඳහන් ලේඛන වල මුල් පිටපත් විශ්වවිද්‍යාලය විසින් යම් අවස්ථාවක ඉදිරිපත් කරන ලෙස දන්වුවහොත් ඉදිරිපත් කිරීමට සුරක්ෂිතව ළඟ තබා ගත යුතුය. (i) ගෙවීම් කරන ලද තැන්පතුපත (ii) ජාතික හැඳුනුම්පත (iii) මාස 06 ක් ඇතුළත ලබාගත් ලා නිල් පසුබිම සහිත පාස්පෝට් ප්‍රමාණයේ පැහැදිලි ඡායාරූපයක් (iv) 2024 අ.පො.ස. උසස් පෙළ ප්‍රතිඵල ලේඛනය.

05. අසම්පූර්ණ හෝ සාවද්‍ය තොරතුරු ඇතුළත් අයදුම්පත් සහ නියමිත කාලසීමාවට පසුව ඉදිරිපත් වන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබේ. එවැනි අවස්ථාවකදී අයදුම්කරුවන් විසින් ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

06. යෝග්‍යතා පරීක්ෂණ සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගේ පරීක්ෂණ ප්‍රවේශ පත ලබා ගන්නා ආකාරය අයදුම්පතෙහි සඳහන් කර ඇති විද්‍යුත් තැපැල් (e-mail) ලිපිනය වෙත දනුම් දෙනු ලැබේ.

07. අයදුම්කරුවන් සඳහා උපදෙස් / මාර්ගෝපදේශ සහ අනෙකුත් තොරතුරු සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙහි (www.vpa.ac.lk) හි "Aptitude Test - 2024 / 2025" වෙත පිවිසෙන්න.

**විමසීම්** - ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / අධ්‍යයන හා ශිෂ්‍ය කටයුතු
011-2026784 / 011-2033710 - Ex - 1003/1004/1005

**ලේඛකාධිකාරී,**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය.**
**2025.05.18**

tamilguru.lk